**සීමා නිර්ණය කොමිෂන් සභාව**

**2019 වර්ෂයේ දෙවන කාර්තුවේ කාර්ය සාධන වාර්තාව**

**2019 අප්‍රේල් 01 සිට 2019 ජූනි 30 දක්වා**

## 1.0 පසුබිම

සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 41B හා 95(1) ව්‍යවස්ථාවන්ට අනුකූලවය. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා ආචාර්ය කේ.තවලිංගම්, සාමාජිකයන් වන ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක හා මහාචාර්ය එස්.එච්.හස්බුල්ලා යන තිදෙනාගෙන් සමන්විත විය. 2018.08.24 වන දින මහාචාර්ය හස්බුල්ලා අභාවප්‍රාප්ත විය. 2015.11.13 දින පත් කරන ලද කොමිෂන් සභාවේ ධූර කාලය 2018.11.13 දින අවසන් වූ බැවින් එදින සිට වසර 3 ක කාලයක් සඳහා සභාපතිවරයා ලෙස ආචාර්ය කේ. තවලිංගම් මහතාද සාමාජිකයකු ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මියද නැවත පත් කරන ලද අතර පුරප්පාඩු වී තිබූ සාමාජික තනතුර සඳහා 2019.03.11 වන දින ඒ.එම්. නහියා මහතා පත් කරන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් කියැවේ. කෙසේ වුවද අනිකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් මෙන් නොව මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යයන්
- කොමිෂන් සභාවේ බලතල

ආරම්භයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉඟිකරන ලද අදහස වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී තනි සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීමට හා එහි වගකීම් භාරය විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කරන බවය.

## 2.0 **දැක්ම**:- සාදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය කරා ළඟා වීම

**මෙහෙවර-**:ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස හා සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමවද, පාරදෘශ්‍යතාවයෙන් යුක්තවද, විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

**අරමුණු**

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරිම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරිම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## 3.0 ප්‍රතිපත්තිමය කරුණු

### 3.1 ක්‍රියාකාරි සැලැස්ම

වර්ෂය තුළදී අපේක්ෂිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු නොවිය. එබැවින් ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. කෙසේ වුවද පහත ක්‍රියාකාරකම් ඇතුළත් කර 2019 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදි. (පළමු කාර්තු වාර්තාවේ ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.)

1. සැලසුම්කරණය හා පුහුණුව
2. තොරතුරු එක් රැස් කිරීම(පරිපාලන ඒකක හා පළාත් පාලන ආයතන පිහිටුවීමට අදාළ සියලුම ගැසට් නිවේදන එකතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.)
3. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩකඩම් පිළිබඳ ප්‍රමුඛතා පෙරදැරිකොට පසුගිය පාර්ලිමේන්තු ඡන්ද විමසීම් හා බැඳි සීමා නිර්ණය වාර්තා විශ්ලේෂණය කිරීම
4. පරිපාලන කොට්ඨාස වල සීමා පිළිබඳව අධ්‍යයනය
5. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීම පිළිබඳ අධ්‍යයනය
6. වර්තමානයට ගැලපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම

### 3.2 පළාත් සභා සඳහා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම

2017 පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත 2017.09.20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. 2017.10.04 දින ජනාධිපතිවරයා විසින් මේ කාර්යය සඳහා සීමා නිර්ණය කමිටුවක් පත්කරන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් දෙදෙනාද මෙම කමිටුවේ සාමාජිකයන් බවට පත් කරන ලදහ. සම්පූර්ණ කරන ලද වාර්තාව 2018.02.19 වන දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට භාරදෙන ලදි. එය 2018.03.06 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි. 2018.08.24 දින එම වාර්තාව විවාදයට පාත්‍ර විය. ඉන් පසු එය සමාලෝචන කමිටුවකට යොමු කරන ලදි. වාර්තාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ගන්නා ඊලඟ පියවර පිළිබඳව සීමා නිර්ණය කොමිෂන් සභාව අවධානයෙන් සිටී.

## 4.0 ගත වූ මාස තුන තුළ කාර්ය සාධනය

### 4.1 රැස්වීම්

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්**:- මෙම කාර්තුව තුළ පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් තුනක් පවත්වන ලදි.

37 වැනි රැස්වීම - 2019.04.02
38 වැනි රැස්වීම - 2019.05.02
39 වැනි රැස්වීම - 2019.06.14

### 4.2 සීමා නිර්ණය හා ඊට අදාළ ගැටලු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

සීමා නිර්ණය මාතෘකාව හා ඊට අනුශාංගික වූ ගැටලු පිළිබඳ මහජන අවබෝධය ඉහළ නංවාලීම සඳහා පුවත්පත් වලට ලිපි සැපයීමට හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ සම්පත් දායකත්වයෙන් වෘත්තිකයන්ගේ සංවිධාන සාමාජිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැත්වීමට සීමා නිර්ණය කොමිෂන් සභාව සැලසුම්කර ඇත.

මෙහිදී ප්‍රධාන වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය, මැතිවරණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා සුදුසු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම කාර්තුව තුළ රටේ පැවති ආරක්ෂිත තත්වය සහ

දිස්ත්‍රික් පරිපාලන නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් වැඩ සටහන් සංවිධානය සඳහා ගැටලු මතුවිය. එබැවින් බලාපොරොත්තු වූ පරිදි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කල නොහැකි විය.

කොමිෂන් සභාවේ සභපති සහ සම්බන්ධීකරණ ලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාවේ "කතිරයේ බලය" නම් වූ සහරාවෙහි වෙළුම 3, ජනවාරි-අප්‍රේල් 2019 කලාපය සඳහා සීමා නිර්ණය පිළිබඳ වූ ලිපියක් ඉදිරිපත් කරන ලදි. සභාපතිවරයා සමග සීමා නිර්ණය පිළිබඳ කළ සාකච්ඡාවක් 2019.06.12 වන දින සිළුමිණ පුවත්පතේ පළ විය.

සීමා නිර්ණය විෂය පිළිබඳව මහජන අවබෝධය ඉහළ නංවාලීම සඳහා ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක විසින් 2019.04.11, 2019.04.18 සහ 2019.05.21 යන දිනවලදී Sunday Island, Sunday Times සහ Daily Financial Times යන ඉංග්‍රීසි පුවත්පත්වල "Delimitation of Electoral Boundaries in Sri Lanka Smaller Electoral Units Needed to Serve the People Better" යන මාතෘකාව යටතේ තුන්වන ලිපිය පළකරන ලදි. පළමු සහ දෙවන ලිපි වල සිංහල පරිවර්තනය සිදුකර පළමු ලිපිය 2019.05.30 වන දිනද දෙවන ලිපිය 2019.06.27 වන දිනයෙදී ද ලංකාදීප පුවත්පතේ පළ කරන ලදි.

මෙම කාර්තුවේදී හතරවන ලිපිය Sunday Island, Sunday Times සහ Daily Financial Times යන පුවත්පත්වල "Delimitation of Electoral Boundaries in Sri Lanka Multi-member Electorates – Perceptions and Realities" යන මාතෘකාව යටතේ 2019.04.14, 2019.04.21 සහ 2019.05.29 යන දිනවලදී පළ කරන ලදි.

දැනට පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාස වල ඇති අසමතුලිතතාවන් නිසා ඇති වී තිබෙන ගැටලු පිළිබඳව වාර්තාවක් සකස් කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට කොමිෂන් සභාව තීරණය කරන ලදි.

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ මැනුම් විද්‍යාව හදාරන ශිෂ්‍යයෙකු විසින් තම අවසන් ව්‍යාපෘතිය ලෙස ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මායිම් සලකුණු කිරීම තෝරාගෙන ඇති අතර එහි අධීක්ෂණ කාර්යය භාර ගන්නා ලෙස සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති අචාර්ය කේ.තවලිංගම් මහතාගෙන් කරන ලද ඉල්ලීම පිළිගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය සීමා නිර්ණය සම්බන්ධ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් ඒ සඳහා උපරිම සහය ලබාදිය යුතු බවට කොමිෂන් සභා සාමාජිකයන් එකඟ වී ඇත.

## 5.0 පරිපාලනමය හා මූල්‍ය කරුණු

### 5.1 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යාල පහසුකම්

2016 වර්ෂයේ සිට සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩ සලසා දී ඇත.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**

සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගෙඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ 05

### 5.2 ප්‍රවාහන කටයුතු

මහා භාණ්ඩාගාරය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේදී වාහන 2ක් ලබා දෙන ලදි. CAP 7180 දරණ වාහනය ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර එනමින් රක්ෂණය කර ඇති අතර එය සභාපතිවරයා සඳහා වෙන් කර ඇත. දෙවැනි මෝටර් රථය CAR 0347 ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුයුක්ත කරන ලදි. මෙම වාහන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සියලුම ප්‍රවාහන කටයුතු සඳහා තවදුරටත් යොදාගනු ලැබේ.

### 5.3 සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

මෙම කාර්තුව තුළ පහත සඳහන් පත්වීම් සිදුකර ඇත.

- වැඩ බලන ලේකම් - සමන් ශ්‍රී රත්නායක මහතා -: 2019 මාර්තු 21 දින සිට වැඩ බලන ලේකම්වරයාගේ පත්වීම වසරකට දීර්ඝ කර ඇත.

- වැඩ බලන ගණකාධිකාරි - එච්.ඩබ්.එන්.කුමාර මහතාගේ පත්වීම් කාලය 2019.03.31 න් අවසන් අතර 2019 අප්‍රේල් 01 දින සිට වැඩ බලන ගණකාධිකාරි ලෙස එස්.ටී.බුලත්සිංහල මහතා පත් කර ඇත.

මේ අනුව 2019.06.30 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

[a] -අර්ධ කාලීන

## 6.0 නොවිසඳුනු කාරණා

සීමා නිර්ණය කොමිෂන් සභාව සිය 2018 ද්විතීය, තෘතීය හා චතුර්තීය කාර්තුවල සහ 2019 පළමු කාර්තුවේ වාර්තාව මඟින් ඉස්මතුකොට දක්වන ලද නොවිසඳුනු ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී. ඒවා නම්,

1. පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවට නියමිත කාර්යභාරයක් නියම වී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ පවත්නා අනපනත් හා කාර්ය පටිපාටි කිහිපයක් මඟින් මැතිවරණ කොට්ඨාස හා පරිපාලන මට්ටම්වල විවිධාකාරයේ සීමා නිර්ණයන් සිදු වෙමින් පවතින අතර මෙම ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබීමට නම් ඒ සියල්ල යථායෝග්‍ය ලෙස සිදු කළ යුතුය.

2. එවන් තත්වයක් ඇති කිරීමේ අරමුණින්,
   - 2016 ජූලි මාසයේදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරය පුළුල් කිරීම යන මැයෙන් යුතු ප්‍රතිපත්ති යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.
   - එම යෝජනාවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ රාජ්‍ය සේවය පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුවේ ලේකම්වරයා වෙත, සභාපතිවරයා විසින් සකස්කරන ලද " නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සකස්කරන විට සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු කාරණා." යනුවෙන් වූ ඇමුණුමක්ද සහිතව 2016 ජූලි මස ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව අනු කමිටුවේ සැලකිල්ලට භාජනය විය.
   - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කරන විටදී සැලකිල්ලට භාජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කිරීම සඳහා වූ මූලධර්මය ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් සකස් කරන ලද ලිපියක් 2016 ඔක්තෝබර් මාසයේදී එහි සභාපතිවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යවන ලදි.

   සීමා නිර්ණය කොමිෂන් සභාවට මෙම යෝජනා සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

3. සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීමේ අවශ්‍යතාව මත ඒ සඳහා 2017.10.18 දින හා 2018.10.18 දින ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති විග්‍රහ පත්‍රිකාව සහ අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත පිළිබඳ නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගෙන ඇත. ඒ අනුව ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී සීමා නිර්ණය කොමිෂන් සභාවට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කරන බවට ජනාධිපති ලේකම්වරයා විසින් අංක PS/AC/CCU/01/03/05 හා 2019.06.23 දිනැති ලිපියෙන් දන්වා ඇත.